**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වර්ෂ 2000 සහ ඊට පෙර අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) සහතික අයදුම් කිරීම.**

වර්තමානයේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අපගේ එක්දින සේවාව තාවකාලිකව අත්හිටුවා ඇති බැවින්, පහත ක්‍රමවේදයන් ඔස්සේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් විභාග සහතික නිකුත් කිරීම සඳහා සැලසුම් කර ඇත.

I. වර්ෂ 2001 හා ඊට පසු වර්ෂවල පැවැත්වූ අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) සහතික පත්‍ර සාමාන්‍ය පරිදි මාර්ගගත ක්‍රමයට අයදුම් කළ යුතුය. මේ සඳහා https://certificate.doenets.lk/ > “Request Certificates” වෙත පිවිසෙන්න.

II. වර්ෂ 2000 සහ ඊට පෙර වර්ෂවල පැවැත්වූ අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) සහතික පත් ලබා ගැනීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන්න.

1. අදාළ සහතික අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් පහත සබැඳිය හරහා බාගත කර ගන්න.

සිංහල/ ඉංග්‍රීසි අයදුම්පත : https://doenets.lk/documents/downloads/certificates-application-forms/OnedayS.pdf

දමිල අයදුම්පත : https://doenets.lk/documents/downloads/certificates-application-forms/OnedayT.pdf

2. අයදුම් පත මුද්‍රණය කර **නිවැරදිව** සම්පූර්ණ කරන්න. (විශේෂයෙන් ඔබේ තැපැල් ලිපිනය)

**සැ.යු. : ඔබේ සහතිකය නිකුත් කරනුයේ ඔබ විභාගය සඳහා පෙනී සිටි නමින් බව කරුණාවෙන් සලකන්න.**

3. ඔබ දැන් ලබාගැනීමට අපේක්ෂා කරන සහතික වර්ගය හා පිටපත් ගණන අනුව(උපරිම පිටපත් ගණන 3කි) අදාළ ගෙවීම් ලංකා බැංකුවේ පහත සඳහන් ගිණුම් අංකයට බැර කර අදාළ රිසිට් පතේ ඔබේ පිටපත හෝ තිර සටහන (screenshot - මාර්ගගත ගෙවීම් සඳහා පමණි.) ලබාගන්න.

| සහතික වර්ගය | පිටපත් 1 | පිටපත් 2 | පිටපත් 3 |
|---|---|---|---|
| | | | |
| **මෙරට භාවිතය සඳහා (For Local Use) -** | රු. 700/= තැපැල් ගාස්තු ඇතුළත්ය. | රු. 1000/= තැපැල් ගාස්තු ඇතුළත්ය. | රු. 1300/= තැපැල් ගාස්තු ඇතුළත්ය. |
| **විදේශීය භාවිතය සඳහා (විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලබා ගත යුතුය.)** | රු. 600/= | ලබාගත හැකි උපරිමය එක් පිටපතක් පමණි | |
| **Australian Visa** | රු. 700/= තැපැල් ගාස්තු ඇතුළත්ය. | රු. 1000/= තැපැල් ගාස්තු ඇතුළත්ය. | රු. 1300/= තැපැල් ගාස්තු ඇතුළත්ය. |
| **Green Card** | රු. 600/= | | |
| **Foreign Country (ලියාපදිංචි ගුවන් තැපැල මගින්)** | රු. 900/= (තැපැල් ගාස්තු රු.300 ඇතුළත්ය.) | | |

| | | |
|---|---|---|
| ලංකා බැංකුවේ ගිණුම් අංකය | : | **7041228** |
| ගිණුමේ නම | : | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| ශාඛාව | : | බත්තරමුල්ල ශාඛාව |

4. doecertificates@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට පහත සඳහන් ලේඛන ඊමේල් කර එවන්න.
   - නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත.
   - මුදල් ගෙවන ලද රිසිට් පත හෝ තිර සටහන (screenshot).
   - ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පැහැදිලි ඡායාරූප හෝ ස්කෑන් පිටපත්. Australian Visa සහතිකපත් සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපත (Passport copy) **අනිවාර්ය වේ.**

5. ඊමේල් පණිවිඩයේ මාතෘකාව(Title) සඳහන් කරන ස්ථානයේ “Exam Certificates” යනුවෙන් සඳහන් කර “සහතික අයදුම් කරන දිනය” සහ “දුරකථන අංකය” පමණක් ඇතුළත් කරන්න.

   - මෙරට භාවිතය සඳහා ඉල්ලුම් කරන ලද සහතික පත්‍ර ඉල්ලුම් කර දින තුනක් ඇතුළත අයදුම්පතෙහි සඳහන් ලිපිනයට speed post සේවාව හරහා තැපැල් මගින් එවන අතර විදේශීය භාවිතය සඳහා ඉල්ලුම් කරන ලද සහතික පත්‍ර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවනු ලැබේ.

   - එම සියලු තොරතුරු හා සහතික යොමු අංක ඔබගේ ඊමේල් ලිපිනයට පිළිතුරු පණිවිඩයක් ලෙස එවනු ලැබේ.

   - ඔබ Green Card සඳහා සහතික පත්‍රයක් ඉල්ලුම් කරන්නේ නම්, අප විසින් ඔබ වෙත එවන පිළිතුරු පණිවිඩයේ සඳහන් සහතික පත් යොමු අංකය ඇමෙරිකානු තානාපති කාර්යාලයට ලබා දීමට කටයුතු කරන්න. එවිට තානාපති කාර්යාලයේ නියෝජිතයකු පැමිණ විභාග දෙපාර්තමේන්තුවෙන් සහතික පත්‍රය ලබා ගනු ලැබේ.

   - ඉහත ක්‍රියාපටිපාටිය යටතේ සහතික නිකුත් කළ හැක්කේ අයදුම්කරු අදාළ තොරතුරු (උදා: විභාගයේ නම, විභාගයේ වර්ෂය, විභාග අංකය යනාදිය) **නිවැරදිව** ලබා දී ඇත්නම් පමණි.

   - අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් හෝ රිසිට්පත් අඩංගු ඉල්ලීම් හා අවශ්‍ය සියලු ලේඛන එවා නොමැති ඉල්ලීම් පෙර දැනුම්දීමකින් තොරව අවලංගු කිරීමට සිදුවේ. සහතිකවල පිටපත් ඊ-මේල් මඟින් ලබාදීම සිදු **නොකෙරේ.**

   - සහතික නිකුත් කරනු ලබන්නේ විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් නිල වාර්තා මෙම දෙපාර්තමේන්තුව සතුව තිබේ නම් පමණි.